# 02 සත් සති ගෙවුණු හැටි



පඨමං බෝධි පල්ලංකං - දුතියඤ්ච අනිමිසං
තතියං චංකමණං සෙට්ඨං - චතුත්ථං රතනාඝරං
පඤ්චමං අජපාලඤ්ච - මුචලින්දෙන ඡට්ඨමං
සත්තමං රාජායතනං - වන්දෙ තං මුනි සෙවිතං

එකුන්විසි වියේ දී අභිනිෂ්ක්‍රමණය කළ බෝසතාණන් වහන්සේ පන්තිස් වන වියේදී බුදුබව පසක් කළ සේක. එතැන් සිට තමන් ලැබූ විමුක්ති සුවය විඳිමින් උන්වහන්සේ සති හතක් බෝමැඩ අවට ම ගත කළ සේක.

## පළමු සතිය

බුදුරජාණන් වහන්සේ බුදු වූ විදුරසුනේ ම එක ම පර්යංකයෙන් සමවත් සුව විඳිමින් පළමු සතිය බෝමැඩ ම කල් ගෙවූහ. එහි දී පටිච්ච සමුප්පාදය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කළහ. මෙසේ බුදුරදුන් බෝ මුල ම වැඩහිඳිනු දුටු දෙවියන්ගේ සිත් තුළ '' සිද්ධාර්ථ ගෞතමයන් තවම බුදුවී නැද්දෝ' යි සැකයක් උපණි. උන් වහන්සේ එය දුරුකරනු

පිණිස ආපෝ කසිණයෙන් තේජෝ කසිණයටත්, තේජො කසිණයෙන් ආපෝ කසිණයටත් වහ වහා සමවදිමින් ප්‍රාතිහාර්යයක් පෑ සේක. ඒ මොහොතේ බුදු සිරුරින් එකවර ගිනි කඳක් හා දිය කඳක් පිට වෙන්නා සේ දිස්විය. මෙය බුදුරජාණන් වහන්සේ නමකට පමණක් ම පෑ හැකි **යමක මහා ප්‍රාතිහාර්ය** යි. එයින් දෙවියන්ගේ සැක දුරුව ගියේ ය.

## දෙවන සතිය

එම විදුරසුනින් නැගී සිටි උන්වහන්සේ ඊළඟ සතිය සිටිවන ම ගතකළ සේක. ඒ සතිය පුරා තමාට බුදුවීමට උපකාර වූ ඇසතු බෝධීන් වහන්සේ දෙස ඇස්පිය නොහෙළා බලා සිටිය හ. සිත් පිත් නැති ගසකට පවා, කළ උපකාරයට කළගුණ දැක්විය යුතුය යන උදාර ගුණය ලොවට පෙන්වා වදාළ මේ අපූර්ව සිදුවීම **අනිමිස ලෝචන පූජාව** යනුවෙන් හැඳින්වේ.

## තෙවන සතිය

අනතුරුව උන්වහන්සේ අනිමිසලෝචන පූජාව කළ ස්ථානයත් ජය ශ්‍රී මහා බෝධින් වහන්සේත් අතර සක්මන් කරමින් සතියක් ම කල් ගෙවූහ. මෙය **රුවන් සක්මන** ලෙස හැඳින්වේ.

## සිව්වන සතිය

බුදුරජාණන් වහන්සේ සිව්වන සතිය පුරා බෝධීන් වහන්සේට වයඹ දෙසින් පිහිටි රුවන්ගෙහි වැඩ වාසය කළහ. මෙහි දී උන්වහන්සේ අභිධර්මය මෙනෙහි කළ සේක. එයින් උපන් ධර්ම ප්‍රීතිය නිසා උන්වහන්සේගේ බුදු සිරුරින් සවණක් ඝන බුදුරැස් විහිදෙන්නට විය. අභිධර්මයේ සප්තප්‍රකරණ නැමැති රත්නයන් මෙනෙහි කළ තැන බැවින් එය රතනඝර චේතිය (රුවන්ගේ) යන නමින් හැඳින්වේ.

## පස්වන සතිය

මෙසේ සති හතරක් ම බෝමැඩ අවට වැඩසිටි බුදුරජාණන් වහන්සේ පස්වන සතියේ දී අජපාල නුගරුක මුලට වැඩම කළ සේක. එහි දී

තමන් වහන්සේ අවබෝධ කළ නිවන් සුවය විඳිමින් සතියක් කල් ගෙවූහ. එහිදී කවරෙකුට වුවද ගුරුවරයෙකු නැතිව වීසීම දුකකැයි උන්වහන්සේට සිතිණ. එහෙත් තමාට ගුරුවීමට තරම් කිසිවෙකු නොමැති හෙයින් අන්තිමේ දී අවබෝධ කළ ධර්මය ම ගුරු තනතුරෙහි තබාගත් සේක. මේ අතර හ්ම් හ්ම්..... යන අනුකරණයෙන් මානයෙන් අනුන් හෙළා දකින (හුහුංක ජාතික) බ්‍රාහ්මණයෙක් පැමිණ බ්‍රාහ්මණයෙකු වීමට උවමනා කරන ධර්ම විමසා සිටියේ ය. ඊට පිළිතුරු දෙන බුදුරජාණන් වහන්සේ '' සැබෑ බ්‍රාහ්මණයා නම්, පව් බැහැර කළ, මානයෙන් අනුන් හෙළා නො දකින, කෙලෙස් කසට නැති, සතර මාර්ග ඥානයෙන් සත්‍යාවබෝධයේ කෙළවරට ගිය තැනැත්තා ය.'' යි වදාළ සේක. උන් වහන්සේ මෙහි බ්‍රාහ්මණ නමින් හැඳින් වූයේ රහතන් වහන්සේ ය.

මේ අතර දිනක් වසවර්ති මාරයා උන්වහන්සේ වෙත පැමිණියේ ය. සත් වසක් මුළුල්ලේ උන්වහන්සේගේ අඩු පාඩුවක් සොයමින් ලුහුබැන්දත් ඔහුට කිසිවක් හමු නොවීය. එයින් දුකට පත් හෙතෙම බුදුරදුන් වෙත පැමිණ බිම ඉරි අඳිමින් සිටියේ ය. මේ මොහොතේ තණ්හා, රතී, රගා යන මාර දූවරු එහි පැමිණියෝ ය. වසවර්ති නම් සිය පියා අස්වසනු පිණිස ඔවුහු නැටුම් ගැයුම්, වැයුම්වලින් බුදුරදුන් පොළඹවා ගන්නට තැත් කළහ. එහෙත් බුදුරජාණන් වහන්සේ ඒ දෙස වත් නොබැලූහ. ඒ සියලුදෙනා ලැජ්ජාවට පත්ව පලාගියෝ ය.

## හයවන සතිය

ඒ සත් දවස ඇවෑමෙන් බුදුරජාණන් වහන්සේ නේරංජනා නදී තීරයේ පිහිටි මුචලින්ද විලට නුදුරු මිදෙල්ල ගසක් මුලට වැඩම කළහ. එහි සමාධි සුවයෙන් ගතකරද්දී දැඩි සීත සුළං සහිත හත් දා වැස්සක් ඇද හැළුණේ ය. මෙහි දී එතනට පැමිණි මුචලින්ද නම් දිව්‍ය නාගරාජයා බුදුරජාණන් වහන්සේගේ සිරුර සිය දරණ වැලින් සත් වටයක් වෙලාගෙන හිසට ඉහළින් තම පෙනය කුඩයක් සේ විහිදුවාගෙන බුදුරජාණන් වහන්සේ නොතෙමෙන ලෙස සිටියේ ය.

## සත්වන සතිය

සත්වන සතියේ දී බුදුරජාණන් වහන්සේ රාජායතන නම් කිරිපලු රුක මුල සමාපත්ති සුවයෙන් වැඩසිටි සේක. ඒ අතරතුර උක්කලා නුවර

සිට ආ **තපස්සු** හා **හල්ලුක** යන වෙළඳ දෙබෑයෝ බුදුන් වහන්සේ දැක පැහැදී විළඳ සහ මීපිඬු පූජා කළහ. බුදුරජාණන් වහන්සේ ඔවුන්ට දහම් දෙසූහ. ඔවුහු බුදුන් හා දහම් සරණ ගියෝ ය. ඒ වන විට සංඝරත්නය ලොව පහළ වී නොතිබූ නිසා එකම **ද්වේවාචික** උපාසකයෝ ඔවුහු ය.

මෙම උපාසක දෙපල තමාට පිදීම ට වස්තුවක් දෙන්නැයි බුදුන් වහන්සේගෙන් ඉල්ලූ විට උන්වහන්සේ සිය හිස පිරිමැද කේශධාතු ස්වල්පයක් දුන්සේක. ඔවුන් එය රැගෙන විත් ලංකාවේ තිරියායේ තැන්පත් කොට චෛත්‍යක් සැදූ බව සඳහන් වේ.

## අභ්‍යාස

01. පහත සඳහන් වගුව ( ඔබගේ අභ්‍යාස පොතේ සටහන් කර ) පුරවන්න.

| සතිය | වැඩසිටි ස්ථානය | සිදුවූ විශේෂතා |
|---|---|---|
| පළමු සතිය | | |
| දෙවන සතිය | | |
| තෙවන සතිය | | |
| සිව්වන සතිය | | |
| පස්වන සතිය | | |
| හයවන සතිය | | |
| සත්වන සතියය | | |

02. සත් සතියේ ඔබ වඩාත් සිත්ගත් සතිය චිත්‍රයට නගන්න.